// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2334/19 - 2023 මැයි මස 30 වැනි අඟහරුවාදා - 2023.05.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධිත පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : PLDS/LND/04/ACQ/79.
*ඔබේ අංකය*: 4/3/9/2015/ඩබ්එස්/172.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළයේ උඩ පත්තුවේ සුළු කොට්ඨාස අංක 166A උඩතුල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රත්නපුර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අ.ග.පි. ර 323, කැබලි අංක 01 හි පහත විස්තර දැක්වෙන ඉඩම් කැබලි 01.

**කැබලි අංක 01**

ඉඩමේ නම: කුට්ටාපිටිය වත්ත කිරිදිඇල්ල කොටස; හිමිකම් කියන්නන්: 01. පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි - විහාරාධිපති, ශ්‍රී පාද විහාරය සහ ගල්පොත්තාවෙල රජ මහා විහාරය, 02. මහාභාරකාර තැන, මහාභාරකාර දෙපාර්තමේන්තුව, බුලර්ස් පටුමඟ, කොළඹ 07; ඉඩම් පරිහරණය: පැල්මඩුල්ල ජල සම්පාදන ක්‍රමයේ යෝජිත ජල පවිත්‍රාගාරය ඉදිකෙරෙමින් පවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4173.

*උතුරට*: පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි හිමිකම් කියන කුට්ටාපිටියවත්ත කිරිදිඇල්ල කොටස; *නැගෙනහිරට*: පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි හිමිකම් කියන කුට්ටාපිටිය වත්ත කිරිදිඇල්ල කොටස සහ පාර; *දකුණට*: පාර සහ පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි හිමිකම් කියන කුට්ටාපිටිය වත්ත කිරිදිඇල්ල කොටස; *බටහිරට*: පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි හිමිකම් කියන කුට්ටාපිටිය වත්ත කිරිදිඇල්ල කොටස.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.11.06 වැනි දින පෙ.ව. 10.00ට පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023.11.06 වැනි දිනට මත්තෙන් ඒ ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හෝ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**බී. එස්. ජී. රුවන්සිරි,**
ප්‍රාදේශීය ලේකම්,
පැල්මඩුල්ල.

2023 මැයි මස 25 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 - 0261

1A - G 039609 - 14 (2023/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*